# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2120/7 - 2019 අප්‍රේල් මස 23 වැනි අඟහරුවාදා - 2019.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* වීඊ/ඩීඑස්/එල්එල්ඩී/එල්ඒ/පීඒටීඑච්/17.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:*4-3/4/2013/එල්/මේ/546.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩම/පරවශතාවවිස්තර:*

| | | |
|---|---|---|
| මුද්‍රිත පිඹුර | : | යා. *2915* |
| ගම | : | පත්තමෙනි |
| ග්‍රාම නිළධාරී කොට්ඨාසය | : | පත්තමෙනි (ජේ/281) |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | වලිකාමම් නැගෙනහිර |
| දිස්ත්‍රික්කය | : | යාපනය |
| පළාත | : | උතුර |

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: වෙරුකාඩ්; ඉඩමේ විස්තරය: ස්ථිර ගොඩනැගිල්ල, ළිඳ, වැසිකිලිය, සහන ඉඩම; හිමිකම් කියන අය: අනට් නේසරානි, අටෝර්නි බලපත්‍රය - ජේ.එම්. ජෝසප්; ප්‍රමාණය: හෙක්. 0.1417.

ඉහත සඳහන් *ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2019 ජූනි මස 19 වැනි දින පෙ.ව. 10.00ට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 ජූනි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී *ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් නැගෙනහිර,
කෝපායි.

2019 අප්‍රේල් මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කෝපායි.

05 - 90

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ඒසීකිව්වීඅයි/133.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/6/2015/එච්ඩබ්ලිව්/268.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2016.10.10 වැනි දිනැති අංක 1988/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* 8ඒ පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම්



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට් නිවේදනයේ* 114 යටතේ සඳහන් කැබලි අංක 135 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.3976 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට කරමි.

උමේෂා සුරංගි මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

05 - 91

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* ඩීඑස්ඕ/ එච්ඕඑම්/එල්ඒසී/54.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:* එල්ඩී/05/2009/පීසී/92.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1696/26 හා 2011.03.11 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III කොටසේ 2ජ් සහ 3ජ් පිටුවල දැක්වෙන, ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ පරීක්ෂණ පැවැත්වෙන දිනය 2011 මැයි මස 13 වැනි දිනය ලෙස සටහන් වුවද 2014.01.06 වැනි දින අංක 1844/46 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් එම දිනය 2014.03.19 වැනි දිනය වශයෙන් ද, 2016.08.31 වැනි දින අංක 1982/27 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මඟින් 2016.10.12 වැනි දිනය වශයෙන් ද සංශෝධිත, එම පරීක්ෂණ දිනය නැවත මෙයින් සංශෝධනය කරනු ලබන අතර මේ අනුව එම ඉඩමේ හිමිකම් සම්බන්ධයෙන් පරීක්ෂණය 2019.05.30 වැනි දින පෙ.ව.10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සිදුකරන බැවින් මෙම ඉඩමට අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලිඛිත බලය ලත් අයවළුන් මෙම ඉඩමට අයිතිවාසිකම් කීමට ඇති සියලුම ලේඛනවල පිටපත් 2 ක් ද සහිතව මෙම පරීක්ෂණයට පෙනී සිටින ලෙස මෙයින් නිවේදනය කරමි. එසේම පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල ද මෙම දැන්වීමට ඇතුළත් වන බව වැඩිදුරටත් දනුම් දෙමි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 484 - බී පිටිපන නගරය ග්‍රාම නිළධාරී වසමේ පිහිටි මැනුම්පති විසින් පිළියල කර ඇති අංක 520006 දරන කැඩැස්තර සිතියමෙහි කලාප අංක 01 හි පත්‍ර අංක 6 දැක්වෙන කැබලි අංක 119 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1367 විශාල ඉඩම.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

05 - 92

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.